**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ("සමාගම") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කරනු ඇතැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, **පාලනය කරන පාර්ශවයන්** විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි සමාගමේ ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු දෑ

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් සේවා ව්‍යාපෘතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රධාන කළමනාකරු ලෙස සමාගම පත් කිරීමට අදාළව මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුළු ශේෂය වන රු. 246,939,587 න් සියයට 36කට සමාන වන රු. 88,939,587 ක් 2016 වසරේ සිට ශේෂව පවතී. | අපි විසින් ශේෂය අයකර ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම අප ආයතනය මට්ටමින් ගෙන ඇත. සියලුම උපකාරක ලේඛණ සහිත නවතම ඉල්ලීම් ලිපිය 2023.11.22 දින මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නියමිත මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බව සමාගමට නිර්දේශ කෙරේ. |
| ii. | ආදායම් බදු වැඩිපුර ගෙවීම හේතුවෙන්, ලැබිය යුතු ආදායම් බදු ලෙස රුපියල් 67,401,151 ක මුදලක් 2014 වර්ෂයේ සිට පවතී. | මීට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD), IRD විගණනය අවසන් කිරීමට පෙර ආදායම් බදු වගකීම්වලට එරෙහිව ආදායම් බදු වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට ඉඩ නොදුනි. ඒ නිසා අපි එයට හිමිකම් නොකියන ලදි. වර්ථමානයේ, IRD එය ආදායම් බදු වගකීම්වලට එරෙහිව හිලව් කිරීමට ඉඩ දී ඇති අතර අප එය ගෙවිය යුතු 2023/24 තක්සේරු වර්ෂයේ 4 වන බදු වාරිකයට එරෙහිව හිලව් කර ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ලැබිය යුතු ආදායම් බදු අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට සමාගමට නිර්දේශ කෙරේ. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් ආඥාපනතේ 8.1 වගන්තිය සහ CBSL විසින් නිකුත් කරන ලද 2019 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ විධාන. | 2023 මැයි 15 වැනි දින වැරදි SWIFT පණිවිඩ සහ හිමිකරු කේතය ඇතුළත් කර සුරැකුම්පත් ලබා නොදීම හේතුවෙන් සමාගමට රුපියල් 20,991 ක දඩයක් CBSL වෙත ගෙවීමට සිදු විය. කෙසේ වෙතත්, ප්‍රති මිලදී ගැනීම් ගනුදෙනුවේදී සුරැකුම්පත් වෙන් නොකිරීමේ එවැනිම සිදුවීමක් සිදුවීමෙන් පෙර වසරේ ද මහ බැංකුව වෙත රුපියල් මිලියන 259.957ක් අය කර තිබුණි. | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඇති අතර ඒ අනුව අවවාද ලිපි ලබා දීම, වැටුප් වර්ධක අත්හිටුවීම සහ පාඩුව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන අදාළ නිලධාරීන්ගෙන් අලාභය අයකර ගන්නා ලදී. | සමාගම ඒ අනුව විධානවලට අනුකූල විය යුතුය. |

## 1.7 තොරතුරු තාක්ෂණ පොදු පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. සමාගමේ පවතින භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය තම සර්වරයට (server)හෝ NSB සර්වරයට (server) සම්බන්ධ කර නොමැති බැවින්, සමාගම එහි උපස්ථ ක්‍රියාපටිපාටිය ස්වයංක්‍රිය නොවන ලෙස සිදු කළ යුතුය. මේ අනුව, මානව දෝෂ සහ ප්‍රතිආවරණ ගැටලු ඇතිවීමෙන් දත්ත නිරවද්‍යතාවයේ අවදානම වැඩිවීමේ ඉහළ සම්භාවිතාවක් තිබිය හැකිය. | දැනට පවතින භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (TMS) NSB FMC පරිශ්‍රය තුළ පිහිටා ඇති NSB FMC සර්වරයට (server) ස්ථාපනය කර ඇත. එය NSB සර්වරයට (server) සම්බන්ධ නොවේ. උපස්ථයන් දළ වශයෙන් මධ්‍යාහ්න 12:00 සහ සවස 5:00 ට ගනු ලැබේ, පිටපත් මහරගම ආපදා ප්‍රතිආවරණ (DR) වෙබ් අඩවියේ සහ NSB ප්‍රධාන කාර්යාලයේ හවුල් ෆෝල්ඩරයක ගබඩා කර ඇත.<br>NSB FMC විසින් දැනට පවතින භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය නව අනුවාදයකට වැඩිදියුණු කිරීමට ගිවිසුමක් අත්සන් කර ඇති අතර, ස්වයංක්‍රීය උපස්ථ පහසුකම ඇතුළත් වේ. නව වැඩිදියුණු කළ අනුවාදය සජීවී වීමෙන් පසු මෙම ස්වයංක්‍රීය උපස්ථ විශේෂාංගය ක්‍රියාත්මක වනු ඇත. | දත්තවල නිරවද්‍යතාවය සහ වලංගුභාවය සහතික කිරීම සඳහා සමාගමේ උපස්ථ ක්‍රියාපටිපාටිය ස්වයංක්‍රීය කළ යුතු බව නිර්දේශ කෙරේ. |
| ii. සමාගමේ Efixin පද්ධතිය SWIFT පද්ධතිය සමඟ සම්බන්ධ වී නොමැති බැවින්, SWIFT පද්ධතියට වැරදි පණිවිඩ ඇතුළත් කිරීමේ ඉහළ හැකියාවක් පවතී. | පවතින පද්ධතිය වැඩිදියුණු කිරීමත් සමඟ සම්පූර්ණ ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය අවසන් වනු ඇත. කෙසේ වෙතත්, පහත ස්වයංක්‍රීය ක්‍රියාවලිය දැනටමත් ස්ථාපිත කර ඇත.<br>වත්මන් පද්ධතියෙන් (e FixIn) විකුණුම් පණිවිඩවල පෙළ ගොනුව (Text File) උත්පාදනය කරන අතර සත්‍යාපනය සහ බලයදීමේ ක්‍රියාවලිය සඳහා SWIFT SERVER වෙත සෘජුවම ඇතුලත් කරයි. | දෝෂ ඇතිවීමේ අවදානම වැළැක්වීම සඳහා සමාගම සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,641,605,934 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප අලාභය රු. 2,025,825,745ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,667,431,679 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පොළී අනුපාත වැඩිවීම සහ ණය ගැනීමේ පිරිවැය අඩුවීම නිසා ශුද්ධ පොළී ආදායම ඉහළ යාම වර්ධනයට හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පිළිබඳ විශ්ලේෂණය පහත දක්වා ඇති පරිදි වේ;

| විස්තර | විචලනය - හිතකර/ (අහිතකර) (රු.) | විචලනය (%) | විචලනය සඳහා හේතු |
|---|---|---|---|
| පොළී ආදායම | 757,365,924 | 32 | පොළී අනුපාත වැඩි කරන ලදී. |
| ශුද්ධ පොළී ආදායම | 910,513,314 | 1761 | පොළී අනුපාත අඩුවීම නිසා ණය ගැනීමේ පිරිවැය අඩුවීම |
| ගාස්තු සහ කොමිස් ආදායම | (6,328,772) | (31) | NSB භාරකාර ගාස්තුව අත්හිටුවීම |
| ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය උපකරණවලින් ලද ශුද්ධ වෙළඳ ලාභය/ (පාඩුව). | 4,794,432,239 | 190 | වෙළඳපොළ පොළී අනුපාතවල අඩුවීම සහ ආයෝජන කළඹෙහි සාමාන්‍ය වෙළඳපොළ ප්‍රතිලාභ අඩුවීම. |
| පුද්ගල පිරිවැය | 24,730,874 | 54 | ද්විතියන පදනම මත NSB වෙතින් ප්‍රධාන කළමනාකරුවෙකු පත් කරන ලදී. වර්ෂය තුළ නව සේවකයින් 04 දෙනෙකු බඳවා ගන්නා ලදී. |
| වෙනත් වියදම් | (245,048,699) | (83) | ශ්‍රී ලංකා මහ බැංකුවේ විධාන උල්ලංඝනය කිරීම් වෙනුවෙන් රු. මිලියන 260 ක දණ්ඩන ගාස්තු ගෙවීම නිසා 2022 වසරේ දී අනෙකුත් වියදම් ඉහළ අගයක් ලෙස සටහන් කරන ලදී. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විස්තරය | සමාගම | |
|---|---|---|
| | **2023** | **2022** |
| හිමිකම් මත ප්‍රතිලාභ (%) | 29.8 | (54.5) |
| වත්කම් මත ප්‍රතිලාභ (%) | 9.7 | (18.6) |
| අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය – (අවම අවශ්‍යතාවය - 10%) | 21.3 | 36.7 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2023 අගෝස්තු 29 වැනි දින පවත්වන ලද වෙන්දේසියේදී මාස 03ක භාණ්ඩාගාර බිල්පත් ලංසු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාගමට රුපියල් 782,815 ක ශුද්ධ අලාභයක් දැරීමට සිදු විය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය ඇතිව, බැංකුවේ අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් කර අනතුරු ඇඟවීමේ ලිපියක් නිකුත් කිරීම, වාර්ෂික වැටුප් වර්ධක රඳවා තබාගැනීම සහ වෙනත් අංශයකට මාරු කිරීම මගින් අදාළ නිලධාරියාට එරෙහිව සමාගම දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. තවද ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙන් ද්විතියන පදනම මත නිලධාරියෙක් ලංසු සඳහා අවසරය දීමට පසු කාර්යාලයට අනුයුක්ත කරන ලදි. අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීම සඳහා චක්‍රලේඛ සමඟ උපදෙස් මාර්ගෝපදේශ නිකුත් කර ඇත. | සමාගම ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කළ යුතු අතර එම පාලනයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සොයා බැලිය යුතුය. |
| ii. | සමාගම විසින් CBSL බ්‍රවුසරයේ ගණුදෙණු 07ක් වෙනුවට ගනුදෙනු 08ක් වැරදි ලෙස සටහන් කිරීම හේතුවෙන් 2023 මාර්තු 16 වැනි දින විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් (OMO) ණය ගැනීම් සඳහා සුරැකුම්පත් වැඩිපුර වෙන් කර ඇත. එමගින් සමාගමට රුපියල් 2,217,031 ක සම්පූර්ණ පාඩුවක් දැරීමට සිදු වූයේ ගනුදෙනු 08ක් සඳහා ඇපතැබීමට ප්‍රමාණවත් තොග නොමැති තත්ත්වයක OMO ගනුදෙනුව ක්‍රියාත්මක කිරීම සඳහා වෙළෙඳපොළෙන් සුරැකුම්පත් සොයා ගැනීමට සිදු වූ බැවිනි. | ALCO සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය මත වගකිවයුතු නිලධාරීන්ට අනතුරු ඇඟවීමේ ලිපි නිකුත් කරන ලදී.<br><br>තවද අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම මගින් අභ්‍යන්තර පාලනය ද ශක්තිමත් කරන ලදී. | සමාගම ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කළ යුතු අතර එම පාලනයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සොයා බැලිය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය (මාස 04) සඳහා පත් කර නොතිබූ අතර, එබැවින් උපායමාර්ගික තීරණ ගැනීම සඳහා අනුමැතියක් නොමැති වීමත් සමඟ සමාගමේ ක්‍රියාකාරිත්වයට බාධාවක් විය හැකිය. | NSB FMC යනු NSB හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන අතර NSB හි අධ්‍යක්ෂ මණ්ඩලය NSB FMCහි අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයින් නිර්දේශ කරයි. 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ, NSB හි සභාපති තනතුර පුරප්පාඩු වූ බැවින්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම සඳහා NSB FMC හි සභාපතිවරයා ලෙස කිසිදු සාමාජිකයෙකු නම් නොකළ බැවින්, එහි නිසි පූර්ණ ක්‍රියාකාරිත්වයක් නොතිබුණි. | අදාළ බලධාරීන් සමඟ එක්ව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම සඳහා නිසි ක්‍රියා පටිපාටිය සකස් කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| . i. | එදිනෙදා සිදු වන රජයේ සුරැකුම්පත් ගනුදෙනුවල, අනුකූල නොවීම සහ ගනුදෙනු වලට අදාළව ඇති වන අවදානම් වළක්වා ගැනීම සඳහා දෛනික පදනම මත සත්‍යාපනය කිරීමට සමාගම විසින් විගණන නිලධාරියෙක් අනුයුක්ත කර නොතිබුණි. | මැතිවරණ කාලසීමාව අවසන් වූ වහාම අප දෛනික විගණන නිලධාරියෙකු බඳවාගෙන අනුයුක්ත කරන්නෙමු (අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය දැනටමත් ලබා දී ඇත). | එදිනෙදා ගනුදෙනු සත්‍යාපනය කිරීමට සමාගම විසින් විගණන නිලධාරියෙකු අනුයුක්ත කළ යුතුය. |
| ii. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2023 ජූනි 05 දිනැති අංක 24/13/004/0005/008 ලිපියේ සඳහන් කර ඇති පරිදි, සමාගමේ වැරදි Fin Net වාර්තා ඉදිරිපත් කිරීම් කිහිපයක් මෑතකදී සටහන් විය. මෙමගින් සමාගමේ අදාළ නිලධාරීන් නිසි සැලකිල්ලෙන් තම රාජකාරිය ඉටු කර නොමැති බව පෙන්නුම් කෙරුණි. එබැවින් 2022 වර්ෂයේ දී ද අදාළ නිලධාරීන් හරහා මෙවැනි සිදුවීම් වාර්තා වූ බැවින් කාර්ය මණ්ඩලයේ පුද්ගල වගකීම් වැඩි කරමින් නිලධාරීන්ගෙන් නැවත නැවතත් මෙවැනි වැරදි සිදු නොවීමට නිසි යාන්ත්‍රණයක් තිබිය යුතුය. ඔවුන්ට වාචික සහ ලිඛිත උපදෙස් / අවවාද ලබා දෙන ලදී. | ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇත. CBSL වෙත ඉදිරිපත් කිරීමට පෙර සියලුම FinNet වාර්තා මධ්‍යම කාර්යාලය විසින් පරීක්ෂා කරන ලදි. තවද, මෙවැනි දෝෂ මඟහරවා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ශක්තිමත් කර ඇති අතර රෙගුලාසිමය අවශ්‍යතාවලට අනුකූල වන පරිදි අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කර ඇත. | මෙවැනි දෝෂ මඟහරවා ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර කාර්ය මණ්ඩලය නිසි සැලකිල්ලෙන් තම රාජකාරිය ඉටු කිරීමට පුහුණු කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන කටයුතුවල සිදු වූ ප්‍රමාද

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මාර්තු මස අවසන් වන විට නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සමාගම ඉන්දියාවේ ක්‍රෙඩන්ස් ඇනලිටික්ස් සමාගම සමඟ ගිවිසුමකට එළැඹ ඇත. සමාගම දැනටමත් රුපියල් 53,833,248 ට සමාන වන ඩොලර් 267,131 ක් ගෙවා ඇති අතර මෙය USD 51,000 ක වාර්ෂික නඩත්තු ගාස්තුවක් සමඟ USD 395,706.25 ක මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 67.5 ක් විය. කෙසේ වෙතත්, සමාගමට නියමිත වේලාවට අදාළ සැපයුම්කරුගෙන් සේවාව ලබා ගැනීමට නොහැකි වූ අතර පසුව දෙපාර්ශවය අතර පැවති සාකච්ඡා සමඟ, එම සමාගම 2022 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර පද්ධතිය භාර දීමට එකඟ විය. එය අවසන් කිරීමට එකඟ වූ දින සිට වසර 04කට ආසන්න කාලයක් ගත වී ඇතත්, තවමත් සමාගමට ප්‍රාථමික ගනුදෙනු පද්ධතිය ස්ථාපිත කිරීමට නොහැකි විය. | ක්‍රෙඩන්ස් පද්ධතියේ ප්‍රගතිය සහ කාල රාමුව සැලකිල්ලට ගනිමින්, NSB FMC අධ්‍යක්ෂ මණ්ඩලය, NSB හි නීති අංශයේ උපදෙස් ලබා ගන්නා ලෙසත්, මෙතෙක් ගෙවා ඇති මුදල ආපසු ඉල්ලා විකුණුම්කරුට ලියා තබන ලෙසත් උපදෙස් දුන්නේ, ඔවුන් එසේ කිරීමට ඇති ඉඩකඩ ඉතා අඩු බැවිනි. දැනටමත් අවසන් වී ඇති කාල සීමාව තුළ ගැටළු නිවැරදි කිරීමට හැකි වනු ඇත.<br>NSB FMC දැනටමත් ඔවුන්ගේ උපදෙස් ලබා ගැනීම සඳහා NSB හි නීති අංශයට ලිඛිතව යවා ඇත. | සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු සුමට කිරීම සඳහා නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සමාගම විසින් වේගවත් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2019 වර්ෂයේදී පාරිභෝගික පහසුව සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දීමට සමාගම සැලසුම් කර ඇතත්, විගණන දිනය වූ 2024 මාර්තු 31 දින දක්වාම ජංගම යෙදුමක් හඳුන්වා දීමට සමාගමට නොහැකි විය. | CMS පද්ධතියේ දෙවන අදියර අවසන් වූ පසු ජංගම යෙදුමක් හඳුන්වා දීමට සැලසුම් කර ඇත. | යෝජිත වැඩසටහන් කාලෝචිත ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |
| ii. | 2020 වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණද, විගණන දිනය වූ 2024 මාර්තු 31 දින දක්වාම එම ඒකකය ස්ථාපනය කිරීමට සමාගමට නොහැකි විය. | සමාගම බාහිර පාර්ශවයකින් (Frontier Research) වෙළඳපොළ තොරතුරු ලබා ගන්නා අතර ඉදිරි දැක්මක් සහිත ආර්ථික සමාලෝචනයක් වරින් වර කළමනාකරණයට ඉදිරිපත් කරනු ලැබේ.<br>පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇතත්, NSB සමඟ යෝජිත ඒකාබද්ධ තීරණයත් සමඟ භාරකාර ව්‍යාපාර, ආයෝජන කළමණාකරු වැනි ව්‍යාපාරික කාර්යයන් සීමා කිරීමත් සමඟ එය ක්‍රියාත්මක වී නොමැත. කෙසේ වෙතත්, පර්යේෂණ නිලධාරියෙකු බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති අතර, මැතිවරණ කාලය අවසන් වූ වහාම බඳවා ගැනීම සිදු කෙරේ. | සමාගම පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සලසා දිය යුතුය. |

## 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මෙහෙයුම් අත්පොත අනුව අවම වශයෙන් කාර්තුමය විගණන කමිටු රැස්වීම පැවැත්වීම අවශ්‍ය වුවද, සමාගම නියමිත අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් දෙකක් පමණක් පැවැත්විණි. | අධ්‍යක්ෂ මණ්ඩලය නොමැති වීම හේතුවෙන් 2023.06.12 දින අනු කමිටු පත් කරන ලදී. ඉන් පසුව, පසුගිය කාර්තු 02 සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු 02ක් පවත්වන ලදී. | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, විගණන කමිටු ප්‍රඥප්තියට අනුකූලව පැවැත්විය යුතුය. |